# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1864/3 - 2014 මැයි මස 26 වැනි සඳුදා - 2014.05.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය : T23/CO/43/2003.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2005.08.02 දිනැති හා අංක 1404/06 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2005.07.28 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් නුගේගොඩ, දේවාල පාර, අංක 28ඒ1/1හි පදිංචි යූ. එච්. ප්‍රේමදාස මහතා හා අනෙක් පාර්ශ්වය වශයෙන් අතුරුගිරිය, ඔරුවල හි පිහිටි සිලෝන් හෙවි ඉන්ඩස්ට්‍රීස් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන් ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2014.04.02 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

වී. බී. පී. කේ. වීරසිංහ,  
කම්කරු කොමසාරිස්.

2014 මැයි මස 12 වැනි දින,  
කම්කරු දෙපාර්තමේන්තුව,  
කොළඹ 05.

යොමු අංකය : ටී23/කො/43/2003.

කාර්මික අධිකරණයේදී ය.

යූ. එච්. ප්‍රේමදාස මහතා,  
අංක 28ඒ1/1,  
දේවාල පාර,  
නුගේගොඩ.

පළමු පාර්ශ්වය

නඩු අංකය : A - 3116

සහ

සිලෝන් හෙවි ඉන්ඩස්ට්‍රීස් ඇන්ඩ්  
කන්ස්ට්‍රක්ෂන් කම්පැනි ලිමිටඩ්,  
ඔරුවල,  
අතුරුගිරිය.

දෙවන පාර්ශ්වය

ප්‍රදානය

වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් ගරු කම්කරු අමාත්‍යතුමාට පැවරී ඇති බලතල අනුව ඉහත පාර්ශ්වයන් අතර පවත්නා කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරුවෙකු ලෙස 2005.07.28 වෙනි දිනැති නියෝගයෙන් මා පත් කොට මා වෙත යොමුකර ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ :-

01. "සිලෝන් හෙවි ඉන්ඩස්ට්‍රීස් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන්ස් කොම්පැණි ලිමිටඩ් විසින් 1988.05.11 වෙනි දින සිට 2002.12.11 වෙනි දින දක්වාම කාල සීමාව තුළදී එම සමාගමේ විකුණුම්

කළමණාකරු වශයෙන් වැඩ බැලීමේ පදනම මත සේවයෙහි යොදවනු ලැබූ යූ. එච්. ප්‍රේමදාස මහතා එම තනතුරෙහි ස්ථිර නොකිරීම යුක්තියසහගත ද යන්න හා යුක්තිසහගත නොවන්නේ නම් ඔහුට කුමන අයිතීන් හා වරප්‍රසාදයන් හිමිවිය යුතුද යන්න හා ,

02. සිලෝන් හෙවි ඉන්ඩස්ට්‍රීස් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන්ස් කොම්පැණි ලිමිටඩ්හි වැඩ බලන විකුණුම් කළමණාකරු වශයෙන් 1998 මැයි මස සිට 2002 දෙසැම්බර් දක්වා කාල සීමාව තුළදී සෙනසුරාදා හා ඉරිදා දිනවලදී කාර්යාලයෙන් බැහැරව සමාගමේ අළෙවි ප්‍රවර්ධන කටයුතුවල යෙදීම වෙනුවට වේතනයෙන් 5%ක පදනම යටතේ ගෙවීමක් සඳහා යූ. එච්. ප්‍රේමදාස මහතා හිමිකම් ලබන්නේද යන්න හා එසේ නම් එය කුමන ප්‍රමාණයක් විය යුතුද යන්න පිළිබඳව වේ."

මෙම නඩුවේ ඉල්ලුම්කාර පාර්ශ්වය වෙනුවෙන් ඉල්ලුම්කරු යූ. එච්. ප්‍රේමදාස මහතා සාක්ෂි ලබා දෙමින් ඒ/01 සිට ඒ/43 "බී" දක්වා ලේඛන ලකුණු කර සිටින ලදී.

වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් එම ආයතනයේ සාක්ෂිකරු වන නියෝජ්‍ය මානව සම්පත් කළමණාකර කන්කාන පතිරණගේ නිමල් ප්‍රේමරත්න යන අය 2008.05.02 වෙනි දින දිවුරුම් ප්‍රකාශයක් මගින් සාක්ෂි ලබා දී ඇති අතර, එම දිවුරුම් ප්‍රකාශය මත එම අයගෙන් හරස් ප්‍රශ්න විමසීම සිදු කොට ඇත.

මෙම ආරවුල විමසා බැලීමේදී හා ප්‍රදානය ලබාදීමේදී කාර්මික අධිකරණය විසින් මුලින් සලකා බැලිය යුත්තේ ආරවුලේ පළමුවන කාරණය එනම්, ඉල්ලුම්කරු 1998.05.11 වෙනි දින සිට 2002.12.11 වෙනි දින දක්වා සේවය කල වැඩ බලන විකුණුම් කළමණාකාර තනතුරේ සේවය ස්ථිර නොකිරීම යුක්තිසහගතද, නැතිද යන්න කාරණයයි.

දෙපාර්ශ්වයම ස්වකීය සාක්ෂි විභාගයේදී ගෙන හැර පාන ලද පොදු කරුණක් වන්නේ වගඋත්තරකාර ආයතනය පෞද්ගලීකරණයට භාජනය වූ විට කලින් පැවති කළමනාකරීත්වය යටතේ යම් යම් සේවකයින් භුක්ති විඳි වරප්‍රසාදයන් හා අයිතීන් ඉන් අනතුරුවද පවත්වා ගෙන ගිය බවය. නඩුවේ සාක්ෂිමය කරුණු දීර්ඝ ලෙස විමසා බැලීමේදී හා මෙම ආරවුලට හේතු වී පවත්නා කාරණය බේරුම් කිරීම සඳහා යොමු කිරීමේදී පහත සඳහන් කරුණු කෙරෙහි දැඩි ලෙස අවධානය යොමු කර සිටීම වැදගත්ය.

(i) ආරවුලට හේතු වී පවත්නා පළමු කරුණ එනම්, තනතුරේ ස්ථිර නොකිරීම යන ආරවුල පැන නගින අවස්ථාවේ ඉල්ලුම්කරු හා සේවා යෝජක අතර, සේවක - සේව්‍ය සම්බන්ධයෙන් පැවතියාද යන්න ;

(ii) සේවක - සේව්‍ය සම්බන්ධය පැවති කාලය අතරතුරදී තම තනතුර ස්ථිර කරවා ගැනීම සඳහා ඉල්ලුම්කරු සාධාරණ උත්සාහයක් දරා ඇතිද යන්න.

සාක්ෂිමය කරුණු සහ බේරුම්කරණ යොමුව අනුව පැහැදිලි වන්නේ ඉල්ලුම්කරු හා සේවා යෝජක අතර පැවති සේවක - සේව්‍ය සම්බන්ධය 2002 වසරේ 12, 11 වෙනි දිනෙන් පසුව අවසන්ව ඇති බවය. එමෙන්ම සේවක - සේව්‍ය සම්බන්ධය පැවති කාලය තුළ මෙම කරුණ පිළිබඳ ඉල්ලුම්කරු හා සේවා යෝජක අතර ආරවුලක් නොමැති බව ඉතා පැහැදිලිය. එම කරුණ ඉල්ලුම්කරු විශ්‍රා ගැන්වීමට ආසන්න කාලය තුළ ලියා ඇති 2002.11.20 වෙනි දින දරන ලේඛනය අනුව පැහැදිලි වේ. එම ලිපිය අනුව ඉල්ලුම්කරු වගඋත්තකරුගෙන් ආයාචනය කොට ඇත්තේ විකුණුම් සහකාර තනතුරේ ස්ථිර කිරීම නොව විශ්‍රාම යාමේ කාලය අවුරුදු 55න් පසු දීර්ඝ කරන ලෙසය. එමෙන්ම මෙම ආරවුල බේරුම්කරණය සඳහා යොමු වූයේ වර්ෂ 2005 වර්ෂයේදී වන අතර, එම කාලය වන විට සේවක - සේව්‍ය සම්බන්ධය අවසන්ව වසර 03කට ආසන්න කාලයක් ගතවී ඇති බැවින් එවැනි කරුණක් සඳහා මැදිහත්වීම කාර්මික අධිකරණයට යුක්තිසහගත හා සාධාරණ කරුණු නොමැති බව නිගමනය කිරීමට සිදු වේ. තවද සේවා යෝජක ලවා සේවය ස්ථිර කරවා ගැනීම සඳහා සාධාරණ උත්සාහයක් සේවා කාලය තුළ ඉල්ලුම්කරු විසින් දරා නොමැති බවට ඉදිරිපත් වී ඇති සාක්ෂි අනුව නිගමනය කළ හැක.

මීළඟට අධිකරණය විසින් සලකා බැලිය යුතු කරුණ වන්නේ ආරවුලට හේතු වී පවත්නා දෙවෙනි කාරණය පිළිබඳවය. එනම්, 1998 මැයි මස සිට 2002 දෙසැම්බර් මස දක්වා ලැබිය යුතු දීමනාවන් සම්බන්ධවයි.

ඉල්ලුම්කරු විසින් එම ආරවුලට අදාළ කරුණු තහවුරු කිරීම සඳහා ලේඛන ගණනාවක් ලකුණු කොට ඇත.

කෙසේ වෙතත් එම දීමනාවන් හා හිමිකම් ගණනය කිරීම සඳහා පාදක කර ගත් කරුණු මොනවාද යන්න සනාථ කිරීම සඳහා සාක්ෂිමය කරුණු ඉදිරිපත් කිරීමට අපොහොසත්ව ඇත. එම දත්ත ගණනය කිරීම සඳහා යොදා ගත් ලේඛනමය මූලාශ්‍ර මෙවැනි ආරවුලකදී හෙළිදරව් කිරීම හා එම කරුණු සාක්ෂි වශයෙන් ඉදිරිපත් කිරීම අත්‍යාවශ්‍ය කරුණකි.

දෙපාර්ශ්වය විසින් ඉදිරිපත් කර ඇති ලේඛනමය හා සාක්ෂිමය කරුණු වැඩිදුරටත් විශ්ලේෂණය කිරීමේදී මෙම ආරවුලට හේතු වී පවත්නා කාරණා දෙක සම්බන්ධව මැදිහත් වීමට හා ඒ අනුව සහනයක් ලබා දීමට තරම් සාධාරණ හේතුන් මෙම අධිකරණය ඉදිරියේ ඉදිරිපත් නොවී ඇති බැවින් ඉල්ලුම්කරුගේ ඉල්ලීම නිෂ්ප්‍රභා කරමි. එම ප්‍රදානය සාධාරන හා යුක්තිසහගත ප්‍රදානයක් වශයෙන් වැඩිදුරටත් නිගමනය කර සිටිමි.

එන්. සී. වී. කුලතුංග,
බේරුම්කරු.

2014 අප්‍රේල් මස 02 වැනි දින.

06 - 222

මගේ අංකය : IR/15/09/2010.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2011.02.18 දිනැති අංක 1693/23 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2011.02.01 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් පිළියන්දල, මාම්පේ, සිරිමංගල වත්ත, 4 වන පටුමග, නො. 385හි පදිංචි එම්. එස්. දමයන්ති මිය හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොලොන්නාව, නිමාව හි පිහිටි සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2014.01.22 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

වී. බී. පී. කේ. වීරසිංහ,
කම්කරු කොමසාරිස්.

2014 මැයි මස 07 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංකය : IR/15/09/2010.

කාර්මික අධිකරණයේදී ය.

එම්. එස්. දමයන්ති මිය,
නො, 385, 4 වන පටුමග,
සිරිමංගලවත්ත,
මාම්පේ,
පිළියන්දල.

ඉල්ලුම්කරු

නඩු අංකය : A/3374

සිලොන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ්
ටර්මිනල්ස් ලිමිටඩ්,
නිමාව,
කොලොන්නාව.

වගඋත්තරකරු

ප්‍රදානය

වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වගන්තියෙන් ගරු කම්කරු අමාත්‍යතුමාට පැවරී ඇති බලතල අනුව ඉහත පාර්ශ්වයන් අතර පවත්නා කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරුවෙකු ලෙස 2011.02.01 වෙනි දිනැති නියෝගයෙන් මා පත් කොට මා වෙත යොමුකර ඇත.

දෙපාර්ශ්වය අතර පවත්නා කාර්මික ආරවුලට හේතු වී ඇති කරුණු වනුයේ :-

"සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් විසින් විගණන සහකාර A 7 ශ්‍රේණියේ තනතුරට උසස්වීම් ලබාදීම සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමේදී ඒ සඳහා ඉදිරිපත් වූ B 2 ශ්‍රේණියේ ලිපිකාරිනී එම්. එස්. දමයන්ති මහත්මියට එම උසස්වීම ලබා නොදීම හේතුවෙන් ඇයට යම් අසාධාරණයක් වූයේද යන්න හා අසාධාරණයක් වූයේ නම්, එම්. එස්. දමයන්ති මහත්මියට කුමන සහනයක් හිමිවිය යුතුද යන්න පිළිබඳව වේ."

දෙපාර්ශ්වය විසින් ඔවුනොවුන්ගේ ප්‍රකාශ හුවමාරු කිරීමෙන් පසු 2011.08.19 වෙනි දින ඉල්ලුම්කාරිය වෙනුවෙන් ඇයගේ නියෝජිත විල්බට් පෙරේරා මහතාගේ මෙහෙයවීම යටතේ ඉල්ලුම්කාරිය සාක්ෂි දීම ආරම්භ කරන ලදී. විල්බට් පෙරේරා මහතා අභාවප්‍රාප්ත වූ පසු ඉල්ලුම්කාරියගේ නියෝජිත ලෙස ජී. ඩබ්. ග්‍රේෂන් සිල්වා මහතා පෙනී සිටින ලදී.

වගඋත්තරකාර පාර්ශ්වය වන සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් යනුවෙන් මානව සම්පත් සහකාර ඊ. ඒ. ආර්. බණ්ඩාර මහතා සමග නීතිඥ එල්. ඩබ්. ගුණසේකර මහතා පෙනී සිටින ලදී.

පැමිණිල්ලේ පෙනී සිටීම නියෝජිත මහතුන් දෙදෙනෙකු වීම නිසා දීර්ඝ සාක්ෂි මෙහෙයවීමක් හා හරස් ප්‍රශ්න ඇසීමක් සිදු වූ අතර, පැමිණිල්ල මගින් ඒ/01 සිට ඒ/18 දක්වා ලේඛන ගොනු කල අතර, විත්තිය මගින් ආර්/01 සිට ආර්/06 දක්වා ලේඛන ගොනු කරන ලදී.

තීරණය ලබා දීමේදී දෙපාර්ශ්වය විසින් ඉදිරිපත් කල සාක්ෂි, ලිඛිත දේශන හා ලේඛන විශ්ලේශණය කිරීමෙන් පහත සඳහන් කරුණු අනාවරණය විය.

(i) ඉල්ලුම්කාරිය 1996.01.01 වෙනි දින B 3 ශ්‍රේණියට එවකට තිබූ අධ්‍යාපන සුදුසුකම් මත බඳවා ගෙන ඇත ;

(ii) ඉල්ලුම්කාරිය සමග උසස්වීම් ලද දෙදෙනාද සේවයට බැඳී ඇත්තේ 1995, 1996 යන වර්ෂවලදී B 3 ශ්‍රේණියට වේ ;

(iii) 2005 වසරේදී දේශපාලන පළිගැනීම් කමිටුව මගින් නිර්දේශ කර කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබා උසස්වීම් ලද දෙදෙනා සමග තවත් අයට එකවර උසස්වීම් දෙක බැගින් ද ඉල්ලුම්කාරියට එක් උසස්වීමක්ද ලබා දී ඇත ;

(iv) A 7 ශ්‍රේණියේ විගණන සහකාර සඳහා 2007.10.24 වෙනි දින සම්මුඛ පරීක්ෂණයට 09 දෙනෙකු අයදුම් කර 07 දෙනෙකු පරීක්ෂණයට ඉදිරිපත් වී ඇත ;

(v) පළමුව ලකුණු ලබා ගත් දෙදෙනාම ඇති වී තිබූ පුරප්පාඩු අනුව A 7 ශ්‍රේණියට උසස් කර ඇත. ඉල්ලුම්කාරියට ලැබී ඇති ලකුණු අනුව සිව්වන ස්ථානය හිමි කර ගෙන ඇත ;

(vi) සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු දීමේ පරිපාටියක් ආයතනය සතුව 1999 වසරේ සිට තිබුණි. ඒ අනුව ලකුණු දීම කර ඇත ;

(vii) මුල් බඳවා ගැනීමෙන් පසු එක් එක් පුද්ගලයින් ලබා ගන්නා අධ්‍යාපන හෝ වෘත්තීය සුදුසුකම් මත උසස්වීම් ලබා ගැනීම සිදුව ඇත ;

(vii) උසස්වීම් ලබා දීමේදී යම් අසාධාරණයක් සිදු වූ විට එම පුද්ගලයින් අධිකරණයේ පිහිට පතා ඇතත්, ඉල්ලුම්කාරිය එවැනි අවස්ථාවල් තිබු බව කීවත් මෙම බේරුම්කාර මණ්ඩලයට පැමිණෙන තෙක් නීතියේ පිහිට පතා නැත ;

ඉහත සඳහන් කරුණු ඉදිරිපත් වූ සාක්ෂිවලට අනුව පහත සඳහන් අයුරු තීරණය කිරීමට සිදු විය.

1996 බඳවා ගැනීමේදී ඉල්ලුම්කාරිය අ.පො.ස. උසස් පෙළ හා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ආවසරික (1) සුදුසුකම් මත B 3 ශ්‍රේණිය ලබා දී ඇත. නමුත් සිරිචන්ද්‍ර සේවයට බැඳී ඇත්තේ 1995.05.24 වෙනි දින වන අතර, සේරසිංහ 1995.12.05 වෙනි දින වෙයි. මෙම තිදෙනාම දේශපාලන පළිගැනීම් කොමිටිය ඉදිරියට 2005 වර්ෂයේදී ගොස් ඇත. එම අවස්ථාවේදී සේරසිංහට හා සිරිචන්ද්‍රට B 1 ශ්‍රේණිය ලබා දී ඉල්ලුම්කාරියට B 2 ශ්‍රේණිය ලබා දී ඇත. එම උසස්වීම් ඇතුළු උසස්වීම්වලට විරුද්ධව හත්සිය තිස් දෙදෙනෙකු (732) හෝ ඊට ආසන්න පිරිසක් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු පවරා ඇත. එම අවස්ථාවේ ඉල්ලුම්කාරිය තමාට අසාධාරණයක් වූවා නම් ඇයද අධිකරණයේ පිහිට පැතිය යුතුව තිබුණි.

දේශපාලන පළිගැනීම් කමිටුවට ඉල්ලුම්කාරිය ඉල්ලුම් කරන ලද්දේ ඇයට අසාධාරණ ස්ථාන මාරුවක් ලබා දීම සහ දුරකථනයෙන් බැන වැදීම බවයි. නමුත් උසස්වීම් ලබා දුන් සිරිචන්ද්‍ර සහ සේරසිංහට උසස්වීම් ලබා දී ඇත්තේ කුමන හේතු මත දැයි හෙළිදරව් නොවේ. එම උසස්වීම මත 2007.10.24 වෙනි දින විගණන සහකාර A 7 ශ්‍රේණියේ තනතුරට පත් කිරීමේදී සේවා කාලය මත සිරිචන්ද්‍රට සහ සේරසිංහට එක ලකුණ බැගින් ලැබුණත්, ඉල්ලුම්කාරිය B 3 ශ්‍රේණියේ බැවින් ලකුණක් ලැබී නැත.

ආයතනය විසින් සම්මුඛ පරීක්ෂණවලදී ලකුණු දීමේ පටිපාටිය 1999 වසරේදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් සම්මත කර ගෙන තිබුණි. ඒ අනුව ලකුණු දීමේ ක්‍රමයට සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දී ඇත. විභාගය සම්පූර්ණයෙන් සමත් නම් අදාළ ලකුණු ලබා දී තිබුණත්, විභාගයේ කොටසක් සමත්වීම සඳහා ලකුණු ලබා දීමට විධි විධාන නොමැති වීම නිසා ඉල්ලුම්කාරියට විශ්ව විද්‍යාලයේ පාඨමාලාව සඳහා ලකුණු ලැබී නැත. අසම්පූර්ණ විභාග සහතික හෝ සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇත්තේ විභාගය පවත්වා ඇත්තේ 2007 වර්ෂයේ සැප්තැම්බර් වන අතර, සම්මුඛ පරීක්ෂණය පවත්වා ඇත්තේ ඔක්තෝබර් මස වෙයි. ඒ වන විට විභාග ප්‍රතිඵල නිකුත් කර නොමැත. සම්මුඛ පරීක්ෂණයට විශ්ව විද්‍යාල දෙවන වසර සමත් බවට සහතිකය ඉදිරිපත් ලකුණක් හෝ නොදුන්නේ නම් ඉල්ලුම්කාරියට යම් අසාධාරණයක් වුණා යැයි සිතීමට තිබුණි.

මෙම නඩුව විභාග කිරීමේදී හෙළිදරව් වූ තවත් විශේෂ කරුණක් වන්නේ මෙම ඉල්ලුම්කාරියට පසුව එනම්, 1996.06.05 වෙනි දින සේවයට එක් වූ කේ. බී. එන්. දීපානි යන අයද A 7 සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වී තුන්වන ස්ථානය ලබා තිබූ බවයි. ඇයගේ ලකුණු ලයිස්තුව ඉදිරිපත් නොවුනත්, ඇයට ඉල්ලුම්කාරියට වඩා වැඩි ලකුණු ලැබී නැත. පුරප්පාඩු නොතිබූ බැවින් ඇයටද උසස්වීමක් නොලැබ ඇත.

සම්මුඛ පරීක්ෂණයේදී ක්‍රීඩා කුසලතා අතිරේක සුදුසුකම් හා විශේෂ කුසලතා අගයමින් අයදුම්කරුවන් ඉදිරිපත් කරනු ලබන සහතික පරීක්ෂ කර ලකුණු ලබා දී ඇත. එම ලකුණු ලබා දී ඇති ආකාරය පරීක්ෂා කිරීමේදී ඉල්ලුම්කාරියට අසාධාරණයක් සිදු වී ඇද්දයි සිතීමට නොහැකි වන්නේ ඇය උසස්වීම ලද සිරිචන්ද්‍ර යන අයට වඩා ලකුණු 02ක් ලබා තිබීමෙනි. එය ඉල්ලුම්කාරියද සාක්ෂි දීමේදී පිළිගෙන ඇත.

සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් වන අයදුම්කරුවන්ගේ කථන දක්ෂතාවය, පෞරුෂත්වය, විශ්වාසනීයත්වය, ස්වභාවික ප්‍රවනතා, චිත්තවේගී ප්‍රතිචාර යන කරුණු ඇගයීමේදී දෙන ලකුණුවලදී ඉල්ලුම්කාරියට ලකුණු 08ක් ලැබී ඇති අතර, තෝරා ගත් සේවකයින් දෙදෙනාට ලකුණු 09 බැගින් ලබා තිබීම අනුවත්, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය එම අවස්ථාවේ ගන්නා ලද තීරණ පිළිබඳ පැහැදිලි තීරණයක් ගැනීමට අවශ්‍ය කරුණු මෙම විභාගයේදී පැහැදිලි කිරීමක් කළ නොහැකි වූවත්, යම් අසාධාරණයක් එහිදීද සිදු වූ යැයි කිව නොහැකිය.

ඉහත සඳහන් පරිදි ඉදිරිපත් වී ඇති සාක්ෂි හා ලේඛන සලකා බැලීමෙන් සත්‍යතාවය වැඩිබර සාක්ෂි මත කිව හැක්කේ ඉල්ලුම්කාරියට B 2 ශ්‍රේණියේ සිට A 7 ශ්‍රේණියට උසස්වීමක් ලබා දීමේ සම්මුඛ පරීක්ෂණයේදී අසාධාරණයක් සිදු වී නොමැත යැයි තීරණය කිරීමට සිදු වෙයි.

මෙම තීරණය සාධාරණ හා යුක්තිසහගත යයි මාගේ නිගමනයයි.

ආර්. එස්. ආරියප්පෙරුම.

2014 ජනවාරි මස 22 වෙනි දින,
කාර්මික අධිකරණයේ දී ය.

06 - 223

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.